## ලැබිය හැකි ආදායම්.

පැල සිටුවා වසර 02 ක් සම්පූර්ණ වූ පසු දළු නෙළීම ආරම්භ කල හැකිය. වසර 04 ක් සම්පූර්ණ වූ පසු පූර්ණ අස්වැන්න ලැබිය හැකි අතර, සතුටුදායක ලෙස වගාව නඩත්තු කිරීමෙන් අක්කර 1/4 කින් මසකට දළු කිලෝ ග්‍රෑම් 125 ක් පමණ ලැබිය හැකිය. වර්තමාන දළු මිල ගණන් අනුව මසකට රුපි 7500/- ක පමණ අදායමක් ලැබිය හැකිය. දළු නෙළීම සහ අනෙකුත් කටයුතු සදහා පවුලේ ශ්‍රමය භාවිතා වන බැවින්, පොහොර සහ අනෙකුත් වියදම් අඩුකල විට මාසිකව රුපි. 7000/- පමණ ආදායමක් මෙමගින් උපයාගත හැක.

## විශේෂ අවධානය

**නියගයෙන් තේ වගාව ආරක්ෂාකර ගැනීම පිළිදව විශේෂ අවධානය යොමුකල යුතුය. ඒ සදහා නියමිත පරතරයෙන් සෙවනවගා කොට නඩත්තු කිරීම අත්‍යාවශ්‍යවේ. පැල වගාවේදී වසර දෙකක් ගතවනතුරු නිසි පරිදි වසුන් යොදන්න.**

## වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.

**ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින් / ගොවි නියාමක නිලධාරින් / සමෘර්ධි නිලධාරින් හරහා ක්‍රියාත්මක වේ.**

**වැඩි විස්තර සදහා ඔබ ප්‍රදේශයේ තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරි හෝ ප්‍රාදේශයේ කුඩා තේවතු සංවර්ධන සමිතියෙන් විමසන්න.**

## වැඩිදුර විමසීම්


**සාමාන්‍යාධිකාරි**
කුඩා තේවතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත
බත්තරමුල්ල

**දුර.** 011 7 909020 / 21
**ෆැක්ස්** : 2784925 / 28
**ඊ මෙල්** : gmtshda@gmail.com
dpmtea@gmail.com

**ප්‍රාදේශිය කළමණාකරු ( ගාල්ල )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 81, ප්‍රදිපාගාර වීදිය,
කොටුව, ගාල්ල
දු. ක. 091 7201677

**ප්‍රාදේශිය කළමණාකරු ( මාතර )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 31, කාලිදාස පාර,
මාතර
දු. ක. 041 7200799

**ප්‍රාදේශිය කළමණාකරු ( ඌව )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
නව බදුල්ල පාර, බණ්ඩාරවෙල.
දු. ක. 057 7200241

**ප්‍රාදේශිය කළමණාකරු ( රත්නපුර )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 1/28, නව නගරය,
රත්නපුර
දු. ක. 045 7201315

**ප්‍රාදේශිය කළමණාකරු ( කෑගල්ල )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
කෘෂිකර්ම ගොඩනැගිල්ල
කච්චේරිය පාර, කෑගල්ල.
දු. ක. 035 7201254

**ප්‍රාදේශිය කළමණාකරු ( කළුතර )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 51, දඩුගොඩයාවත්ත පාර,
ඉද්දගොඩ, මතුගම
දු. ක. 034 7200183

**ප්‍රාදේශිය කළමණාකරු ( මහනුවර )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 2/7/1, ගන්නෝරුව පාර,
පේරාදෙණිය
දු. ක. 081 7200827

**ප්‍රාදේශිය කළමණාකරු ( නුවරඑළිය )**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 26, හිල්වීදිය,
ගම්පොල
දු. ක. 081 7201863


## ගෘහස්ථ ආර්ථික ඒකක දසලක්ෂයක් ඇති කිරීමේ වැඩසටහන යටතේ

# තේ වගාවට අත්වැලක්



## තේ වගාවෙන් ඔබට තිරසාර ආදායමක්

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

## තේ වගාවට ඉඩමේ යෝග්‍යතාවය.

**මිලි මීටර් 1200 කට වැඩි වර්ෂය පුරා පැතිරුණු වර්ෂාපතනයක් සහිත අඩි 03 කට වැඩි ගැඹුර සහිත මනා වයනයක් හා සරු පසක් ඇති, පසේ ආම්ලිකතාවය පී. එච්. 4.5 - 5.5 ත් අතර පවතින අඩු බෑවුමකින් යුක්ත තේ වගා කරන දිස්ත්‍රික්කයක පිහිටි ඉඩමක් විය යුතුය.**

## තේ වගා ප්‍රදේශ

පහත සදහන් දිස්ත්‍රික්ක තේ වගාවට උචිත දේශගුණික කලාපයන්හි පිහිටා ඇත.

උඩරට / මැදරට : මහනුවර, නුවරඑළිය, බදුල්ල, සහ මොනරාගල ( කොටසක් )

සෙසු ප්‍රදේශ : ගාල්ල, මාතර, රත්නපුර, කෑගල්ල, කළුතර, කොළඹ, හම්බන්තොට (කොටසක්)

## ඔබට ලබාගත හැකි සේවාවන්.

### ♦ තේ නැවත වගාව :-

ඔබට දැනටමත් තේ ඉඩමක් ඇත්නම් හා එහි ඇති තේවගාව දැන් නැවත වගා කළයුතු තත්වයකට පැමිණ තිබේනම් එය කොටස් වශයෙන් නැවත වගා කිරීම අරඹන්න.

- **සහනාධාරය :-** උඩරට/මැදරට ඉඩම් සදහා හෙක්. / රුපි. 250,000 කි.

  සෙසු ප්‍රදේශ වල ඉඩම් සදහා හෙක්. / රුපි. 240,000 කි.

මෙම මුදල වගාවේ ප්‍රගතිය පරිදි වාරික 05 කින් ගෙවනු ලැබේ. අවම බිම් ප්‍රමාණය පර්චර් 10 කි. උපරිමය හෙක්ටයාර් 01 කි.

### ♦ දළු නෙළන තේ ඉඩම්වල පාළු සැපයීම :-

පාළු රහිත ඉඩමක් ලෙස තේවගාව නඩත්තු කිරීමට සමූහ වශයෙන් පිහිටි පාළු පැල සිටුවීම සදහා පැලයකට රුපි. 25/-ක මුදලක් පැල 1000 ක් දක්වා ගෙවනු ලැබේ. උපරිමය අක්කර 01 කි.

### ♦ නව තේවගාව :-

අක්කර භාගයක් හෝ ඊට අඩු තේ ඉඩමක් හිමි අයට අක්කර 1/4 කට නොවැඩි බිම් ප්‍රමාණයක තේ වගාවක් ඇතිකර ගැනීමට හෙක්ටයාරයකට රුපි. 50,000 ක් වූ සහනාධාර මුදලක් ගෙවනු ලැබේ. ( මෙම ආධාර ක්‍රමය අදාල ප්‍රදේශ පිළිබද ප්‍රාදේශිය කාර්යාලවලින් විමසන්න. )

### ♦ තාක්ෂණික උපදෙස් :-

කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන් විසින් වගා කටයුතු සදහා අවශ්‍ය සියළු තාක්ෂණික උපදෙස් ලබාදෙනු ඇත.

### ♦ වගාවට අවශ්‍ය තේ පැල :-

වගා කිරීමට සදහා අවශ්‍ය තේ පැල ඔබටම පිළියෙල කරගත හැකිය. ඒ සදහා අවශ්‍ය ද්‍රව්‍ය ( පොලිතීන්, බැසම්ඩ්, රිකිලි වැනි අවසර පත්‍රයට හිමි මුදලින් ලබාදෙන අතර, තාක්ෂණික උපදෙස් සැපයේ. පැලයක් මිලදී ගන්නේ නම් වර්තමාන මිල රුපි. 15/- ත් - 18/- ක් වේ. ඔබ විසින් නිෂ්පාදනය කරගන්නේ නම් වැයවන්නේ රුපියල් 8 /- ක පමණ මුදලකි.

### ♦ තේ පොහොර :-

දළු නෙළන තේ ඉඩම් සදහා "**මහින්ද චින්තන**" තේ පොහොර සහනාධාර වැඩ සටහන යටතේ රුපි. 2500/- ත් පමණ වටිනා පොහොර කිලෝ 50 ක මිටියක් රුපි. 1000/- ක සහන මිලට ලබාගත හැකිය.

### ♦ තේ පැල තවාන් :-

ඔබගේ ඉඩමේ තේ පැල තවානක් ඇතිකොට අධිකාරියේ ලියාපදිංචි වාණිජ තේ තවාන් ලෙස පවත්වාගෙන යාමෙන් අතිරේක ආදායමක් ලබාගත හැකිය.

**වගා කටයුතු කළයුතු කාලය - නැවත වගාව / අළුත් වගාව යටතේ**

| කාර්යය | වර්ෂය | ඉටුකල යුතු කාලය | |
|---|---|---|---|
| | | නිරිතදිග කලාපය | ඊශානදිග කලාපය |
| 1. පස සංරක්ෂණය<br>2. ඩොලමයිඩ් යෙදීම.<br>3. තෘණ සිටුවීම. | පළමු | ජන. - අප්‍රේල්<br>අප්‍රේල් - මැයි<br>මැයි - ජුනි | මැයි - අගෝ.<br>සැප්. - ඔක්.<br>ඔක්. - නොවැ. |
| 4. තෘණ නඩත්තුව | දෙවන | වසර පුරාම | වසර පුරාම |
| 5. තෘණ ඉවත් කිරීම.<br>6. පැල සිටුවීම.<br>7. වසුන් යෙදීම.<br>8. පළමු පොහොර යෙදීම. | තෙවන | මාර්තු - අප්‍රේල්<br>මැයි - ජුනි<br>ජුනි - ජුලි<br>ජුනි - ජුලි | අගෝ. - සැප්.<br>ඔක්. - නොවැ.<br>නොවැ. - දෙසැ.<br>දෙසැ. - ඉදිරි වසරේ ජනවාරි |

**වගා කටයුතු කළයුතු කාලය - තේ තවාන්**

| කාර්යය | ඉටුකල යුතු කාලය | |
|---|---|---|
| | නිරිතදිග කලාපය | ඊසානදිග කලාපය |
| 1. මලුවල පස් පිරවීම<br>2. රිකිලි සිටුවීම | ජුනි - අගෝ.<br>අගෝ. - සැප්. | සැප්. - නොවැ.<br>දෙසැ. සිට පසු වර්ෂයේ ජන. |
| 3. අගිස් දල්ල කැඩීම | පසු වර්ෂයේ ජන. - පෙබ. | පසු වර්ෂයේ අප්‍රේල් - මැයි |
| 4. පැල සිටුවීම | පසු වර්ෂයේ මැයි - ජුනි | පසු වර්ෂයේ ඔක්. - නොවැ. |

## ආරම්භක වියදම

අක්කර 1/4 ක් සදහා

♦ උදුරා දැම්මේ සිට පැල සිටුවීම දක්වා

| | |
|---|---|
| ශ්‍රම ඒකක - 95 x රුපි. 500/- | = රුපි. 47,500/- |
| පැල සහ අනෙකුත් වියදම් | = රුපි. 26,500/- |
| | = රුපි. 74,000/- |

♦ තේ පැල සිටුවීමේ සිට වසර 02 ක සම්පූර්ණ වී දළු නෙලන අවස්ථාව දක්වා

| | |
|---|---|
| ශ්‍රම ඒකක - 66 x රුපි. 500/- | = රුපි. 33,000/- |
| පොහොර සහ අනෙකුත් වියදම් | = රුපි. 21,000/- |
| | = රුපි. 54,000/- |
| මුළු එකතුව | **රුපි.128,000/-** |